**කො/දේවි බාලිකා විද්‍යාලය**

**පළමු වාර පරීක්ෂණය - 2014**

**බුද්ධ ධර්මය**

**9 ශ්‍රේණිය** | **කාලය පැය 1 1/2**

01. අප සිත් තුළ හට ගන්නා වූ අරමුණට විරුද්ධ වන ස්වභාවය වනුයේ,
    i. රාග චේතනාවය
    ii. ද්වේෂ චේතනාවය
    iii. මෝහ චේතනාවය
    iv. මාන චේතනාවය

02. ජනක කර්මයට අනුබල දෙන එම කුසලාකුසල කර්මයන්ට රුකුල් දෙන කර්මය වනුයේ
    i. උප ඝාතක කර්මයයි
    ii. උප පීළක කර්මයයි
    iii. උපස්ථම්භක කර්මයයි
    iv. ගරුක කර්මයයි

03. නිතර නිතර පුරුද්දක් වශයෙන් කරන කුසලාකුසල කර්මයෝ වන්නේ
    i. ආචිණ්ණ කර්ම
    ii. ආසන්න කර්ම
    iii. කටත්තා කර්ම
    iv. ගරුක කර්ම

04. උපාදි නම් ස්කන්ධ පසයි. එයට අයත් නොවන ධර්මයකි
    i. සංඛාර
    ii. විඤ්ඤාණ
    iii. චක්ඛු
    iv. රූප

05. අල්පේච්ඡ වීම යනු කුසල ක්‍රියාවකි. එහි අර්ථයන් නිවැරදිව දක්වා ඇත්තේ
    i. උදාසීන නොවීමයි
    ii. කිසිවක් ගණන් නොගැනීමයි
    iii. අධික බලාපොරොත්තු තබා නොගැනීමයි
    iv. ආශාවන් ගොඩ ගසා ගැනීමයි

06. සියල්ල පෙරකර්මයට අනුව සිදුවේය යන මතවාදය හැඳින්වූයේ
    i. ඊශ්වර වාදය
    ii. අධිච්ච සමුප්පන්න වාදය
    iii. හේතුඵල වාදය
    iv. පුබ්බෙකත හේතු වාදය

07. සත්සතිය ගතකරන කාලය තුළ පටිච්චසමුප්පාද ධර්මය මෙනෙහි කළේ බුද්ධත්වයෙන්
    i. පළමු සතියේ
    ii. දෙවන සතියේ
    iii. තෙවන සතියේ
    iv. හත්වන සතියේ

08. මුගලන් මහරහතන් වහන්සේගේ ගිහිකළ හැඳින් වූ නම වූයේ
    i. අස්සජි
    ii. කෝලිත
    iii. උපතිස්ස
    iv. සංජය

09. ආනන්දය සතර සෘද්ධිපාද මැනවින් ප්‍රගුණ කළ කෙනෙකුට කැමති නම් ආයුෂ කල්පයක් හෝ ඊට වැඩියෙන් කාලයක් ජීවත් විය හැක. මෙහි සතර සෘද්ධිපාද වලට අයත් නොවන්නේ
    i. රාග
    ii. ඡන්ද
    iii. චිත්ත
    iv. විරිය

10. "මහණෙනි, යම් භික්ෂුවක් මා අනුව යන්නේ නම්, ඒ තෙම .......................... භික්ෂු මෙන් විය යුතුය. මෙහි හිස්තැනට ගැලපෙනුයේ
    i. ආනන්ද
    ii. ධර්මාරාම
    iii. සුභද්‍ර
    iv. මහාකාශ්‍යප

11. බුදුන්වහන්සේ කුසිනාරා නුවර බලා වඩින මග හමු වී බණ අසා පැහැදී සිවුරු පිළි දෙකක් පිළිගැ... කව්ද ?

i. චුන්ද නම් කර්මාර පුත්‍රයා විසිනි
iii. ඝටිකාර බ්‍රහ්මයා විසිනි
ii. පුක්කුසාති නම් මල්ල පුත්‍රයා විසිනි
iv. සුභද්ද පිරිවැජියා විසිනි

12. "හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ" මෙය අඩංගු ව...

i. අරිය පර්යේෂණ සූත්‍රයේ
iii. සංයුක්ත නිකායේ යේලා සූත්‍...
ii. නිබ්බේධක සූත්‍රයේ
iv. මහාපරිනිබ්බාන සූත්‍රයේ

13. බුද්ධ ශාසනය තුළ අවසන් වරට පැවිදිබව ලැබුයේ

i. ධර්මාරාම හිමිය
iii. චුන්ද කර්මාරපුත්‍රයාය
ii. සුභද්ද පිරිවැජියාය
iv. පුක්කුසාති මල්ල පුත්‍රයාය

14. ධර්ම රත්නයේ ගුණ අතරින් "පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි" යන්නෙන් අදහස් වන්නේ

i. නුවණැති පුද්ගලයන් සඳහා වූ ධර්මය යනුයි
ii. නුවණැත්තන් විසින් වෙන් වෙන්ව තමන්ගේම ඥානයෙන් දැනගත යුතුයි යන්නයි
iii. එන්න ඇවිත් බලන්න යන්නයි
iv. තුන් කාලයටම සාධාරණ වූ දහමක් යන්නයි

15. සැරියුත් මහරහතන් වහන්සේ විසින් ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අගතනතුර ලබා ගත් අතර මුග... මහරහතන් වහන්සේ ලබාගත් අගතනතුර වනුයේ,

i. ධර්ම භාණ්ඩාගාරික
iii. ධුතාංගධාරීන් අතර අගතනතුර
ii. ධර්ම සේනාධිපති තනතුර
iv. ඍද්ධිමතුන් අතර අග තනතුර

16. බුදු සිරිත අනුව උන්වහන්සේ තුළ තිබූ ගුණාංගයක් නොවන්නේ,

i. චරිතවත් බව
iii. වැරදි කල්පනා බහුල බව
ii. ඉවසන සුලු බව
iv. සමානාත්මතාවයෙන් යුතුබව

17. හොඳ නායකත්වයක් තුළ තිබිය යුතු උතුම් ගුණාංගයක් නොවන්නේ,

i. වහා කිපෙන සුළු බව
ii. නිවැරදි මග පෙන්වීමකින් යුතු බව
iii. ඉවසන සුලු බව
iv. තම අනුගාමිකයන් ආරක්ෂාකල යුතු බව

18. ස්කන්ධ පරිනිර්වාණය හඳුන්වනු ලබන්නේ

i. සෝපාදිසේස පරිනිබ්බානය
iii. අනුපාදිසෙස පරිනිබ්බානය
ii. මහා පරිනිර්වාණය
iv. අභිනිෂ්ක්‍රමනයයි

19. බුදුරජාණන් වහන්සේ ශ්‍රී දේහය ආදාහනය කළ ස්ථානය වනුයේ,

i. ලුම්බිනි සල් උයනේදී
iii. කුසිනාරා නුවරදී
ii. ගිජ්ජකූට පව්වේදී
iv. මකුට බන්ධන නම් ස්ථානයේ

20. "යෝ ධම්මා හේතුප්පභවා" මෙම ගාථාව අදාල වන ග්‍රන්ථය වන්නේ.

i. චුල්ලවග්ගපාලි
iii. පරිවාරපාලි
ii. මහා වග්ගපාලි
iv. පාචිත්තියපාලි

(ලකුණු 20 X 2 = 40)

## II - කොටස

01) ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) වැරදි ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ ලකුණු කරන්න.

1. බෝසතාණන් වහන්සේගේ නායකත්ව ගුණය පිළිබඳ
   කියැවෙන ජාතකය අපණ්ණක ජාතකය වේ. (..............)

2. හේතුව ඇති විට ඵලය ඇත. හේතුව නැති විට ඵලය නැත. මෙම න්‍යාය
   පටිච්චසමුප්පාද වේ. (..............)

3. සසර සැරිසරණ සත්වයාගේ කුසල කර්මයන් හි විපාක ඔවුන් පසු පස
   එන්නේ ගොනා බැඳි කරත්තය මෙනි. (..............)

4. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුව වූයේ දස අකැප වස්තුව
   කැපයයි කීමයි. (..............)

5. චතුරාර්ය සත්‍ය දේශනාව අන්තර්ගත සූත්‍ර දේශනාව වන්නේ සච්චවිභංග
   සූත්‍රයයි. (..............)

(2 X 5 = 10)

02) හිස්තැන් පුරවන්න.

1. මරණින් මතු දෙවන භවයේ විපාක දෙන කර්මය .................................. නම් වේ.

2. රූප, වේදනා, සංඥා, සංඛාරා, විඥානා යන ස්කන්ධ ධර්මයන් හඳුන්වන නමක් වන්නේ.
   ..................................

3. "යථා අඤ්ඤතරං බීජං" යන ගාථා පාඨය උපුටා ගන්නා ලද්දේ .................................. සූත්‍රයෙනි

4. උපයන ධනය වියදම් කල යුතු එක් ආකාරයකි. ..................................

5. සත්සතිය තුළ අනිමිස ලෝචන පූජාව පැවැත්වූයේ .................................. සතියේය.

(ආපදායු භවිස්සතිය , උපාදි , සේලා සූත්‍රයෙහි , දෙවන සතියේය, උපපජ්ජවේදනීය)

(2 X 5 = 10)

The National e-learning Portal for The General Education

## III - කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) කර්මය කෘත්‍ය වශයෙන් සතර ආකාරවේ

1. ඉන් දෙකක් නම් කරන්න.
2. ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.
3. කර්මඵලය පිළිබඳ ඔබ විශ්වාස කිරීමට සාධාරණ වූ හේතු 2 ක් බුද්ධ දේශනාව අනුව ලියන්න.

02)

1. නිර්වාණය අවබෝධකර ගැනීම සඳහා අප මුලින් උපුටා දැමිය යුතු ක්ලේෂ ධර්මය කුමක්ද ?
2. අනුපාදිසේස නිර්වාණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
3. "නිවන උතුම්ම සැපතයි" මේ කියමන සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරන්න.

03)

1. ජීවිතය හා ලෝකය පිළිබඳ නිවැරදි අවබෝධය ඇතිකර ගැනීමට උපකාර වන කරුණු 2 ක් දක්වන්න.
2. ධර්මරත්නයේ ගුණ නම් කරන්න.
3. ඉන් එක් ගුණයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

04)

1. විපතක් පැමිණි විට අප දිරියෙන් මුහුණ දීමට නම් අපතුල තිබිය යුතු ගුණාංග 2 ක් නම් කරන්න.
2. බෝසතානන් වහන්සේ විපත් වලට මුහුණ දුන් ආකාරය දැක්වෙන ජාතක කතාවකින් ගත හැ ආදර්ශයක් කෙටියෙන් ලියන්න.
3. උපයන ධනය බෙදා වෙන් කල යුතු කොටස් නම්කර එය කෙටියෙන් පහදන්න.